**කෑගල්ල ප්‍රාදේශීය සභාව - 2023**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෑගල්ල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කෑගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීමේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නඩු ගාස්තු සඳහා රු. 123,000 ක් වැයකර තිබුණද, ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | දිසා අධිකරණයේ නඩුවක් පවතින බව. | නඩු පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | පිළිගනිමි. ඇතුළත් කරන බව. | ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. |
| (ආ) | වැඩ නිම කළ කර්මාන්ත 03 ක වටිනාකම රු.1,875,027 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුවේ. |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට ඖෂධ ගබඩා ශේෂය රු.1,064,956 ක් මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැර තිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරන බව. | -එම- |
| (ඈ) | 2015 වර්ෂයේදී විශ්‍රාම දෙපාර්තමේන්තුවට වැටුප් ගෙවිය යුතු රු.75,908 ක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | 2024 වර්ෂයේදී නිරවුල් කරන බව. | -එම- |

### 1.6.3 නොසැසඳුණු පාලන ගිණුම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයන් 11ක 2023 දෙසැම්බර් 31 දිනට උපලේඛන අනුව ශේෂ හා ස්ථාවර වත්කම් ලේඛනය අනුව එදිනට එම ශේෂ අතර රු.13,314,423 ක වෙනසක් පැවැතිණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ශේෂ නිවැරදි කර ගත යුතුවේ. |
| (ආ) | ගිණුම් විෂයන් 02 ක 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව එදිනට එම ශේෂ අතර රු.1,067,033 ක වෙනසක් පැවැතිණි. | - එම - | - එම - |

### 1.6.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.67,957,743 ක් වූ ගිණුම් විෂයන් 05 ක් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | අදාල ලේඛන හා උපලේඛන අමුණා ඇති බව. | ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූලනොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 119 | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලින් පනවන ලද රු.19,200 ක අධිභාර වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර නොතිබුණි. | ඉදිරියේදී කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | වාහන 16 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | එම පරීක්ෂාව මේ වන විට සිදුකරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | 2020 ඔක්තෝබර් 02 දිනැති අංක 2020/05 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සභාව සතු රු.971,877 ක් වූ වාහන 02 ක් වර්ෂ 10ත් වර්ෂ 13ත් අතර කාලයක සිට අක්‍රියව පවතින නමුත් අවශ්‍ය අනුමැතිය නොලැබීම නිසා අපහරණය කර නොතිබුණි. | මෙම සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් වෙත නැවත ලිපියක් යොමු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | 2010 මාර්තු 24 දිනැති අංක 08/2010 පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ සංග්‍රහය | බල ප්‍රදේශයට අයත් සුසාන භූමි 49ක්, සුසාන භූමි ලෙස ප්‍රකාශයට පත්කර ඒවායේ අයිතිය පවරාගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එම දේපළ තුළ වූ ගස් පිළිබඳ ලේඛනයක් ද නඩත්තු කර නොතිබුණි. | අයිතිය පවරාගෙන තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බවත් ඵලදාව ලබා ගැනීමට හැකි සහ නොහැකි ගස් ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.35,890,664 වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 42,347,642 ක් විය.

## 2.2. ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්තළ ආදායම්, රැස්තළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| වරිපනම් හා බදු | 3,578,150 | 4,134,358 | 4,452,973 | 1,616,569 | 3,237,700 | 3,368,627 | 2,148,977 | 2,345,531 |
| කුලී | 3,113,500 | 2,844,578 | 2,732,243 | 270,834 | 4,134,400 | 3,904,325 | 3,721,175 | 280,745 |
| බලපත්‍ර ගාස්තු | 780,100 | 749,495 | 749,495 | - | 980,100 | 882,246 | 882,246 | - |
| වෙනත් ආදායම් | 8,659,000 | 8,470,637 | 7,070,911 | 1,399,726 | 3,996,500 | 6,160,291 | 4,256,085 | 1,904,205 |
| | **16,130,750** | **16,199,068** | **15,005,622** | **3,287,129** | **12,348,700** | **14,315,489** | **11,008,483** | **4,530,481** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05කට වඩා පැරණි රු.541,983ක හිඟහිටි වරිපනම්, අක්කර බදු හා කුලී ශේෂයක් පැවැතිණි. | ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කරන බව. | - එම - |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේදී වැඩිපුර ගෙවූ රු.34,384 ක් නැවත අයකර නොතිබුණි. | කඩිනමින් සොයා බලා නිරවුල් කරන බව. | වැඩිපුර ගෙවීම් නැවත අය කළ යුතුවේ. |
| (ආ) | 2022 වර්ෂයේ වැඩ නිම කළ මොරොන්තොට පොදු වෙළඳ සංකීර්ණයේ උඩු මහල සැලසුම් කළ පරිදි කුලියට දීමට නොහැකි වීම නිසා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගෙන ඇති රු.9,000,000ක මුදල පියවීමට නොහැකි වී තිබුණි. | ආදායම් උපයා ගැනීමට කඩිනමින් ඉටුකරන බවත් නැවත මෙවැනි කටයුතු නොවීමට වගබලා ගන්නා බව. | සභාවට ලැබිය යුතු ආදායම් උපයා ගත යුතු වේ. |
| (ඇ) | අක්කර 1½ ක් වූ රංවල පොදු සුසාන භූමිය 2019 වර්ෂයේ සුසාන භූමියක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතව තිබුණ ද, එය ඉටු වී නොතිබුණි. | ඉක්මනින් තොරතුරු සොයා රංවල පොදු සුසාන භූමියේ සංවර්ධන කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව. | යෝජිත පරිදි කටයුතු කළ යුතුවේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්වයංක්‍රිය මහන මැෂිමක් 2022 සිට අභාවිතව පවතින අතර 2021 වර්ෂයේ මිල දී ගත් රු.48,800 ක් වූ ලීටර් 160 කොම්පෝස්ට් බඳුන් 08 ක් බෙදා හැරීමට කටයුතු නොකර ගබඩාවේ රඳවා තිබුණි. | ඇඳුම් සහ බෑග් මැසීමේ ස්වයං රැකියා පුහුණු වැඩසටහන 2024 නැවත ආරම්භ කර ඇති අතර කොම්පෝස්ට් බඳුන් සභාව සතු පොදු ස්ථානවලට ලබා දීමට කටයුතු කරමින් පවතී. | අභාවිත වත්කම් භාවිතා කළ යුතුවේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.1,585,521 ක් වූ වාහන 03 ක් සහ ජල බවුසරයක් මාස 06ත් වසර 13ත් අතර කාලයක සිට නිෂ්කාර්යව පවතී. | වාහන 02ක් අපහරණය කරන බව හා ජල බවුසරය අලුත්වැඩියා කර භාවිතයට ගන්නා බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුවේ. |
| (ආ) | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් වසරකට අධික කාලයක සිට අබලි ද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා භාවිතා කරමින් පවතී. | එම භාණ්ඩවල අපහරණ කටයුතු මේ වන විට සිදුවෙමින් පවතින බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සංඛ්‍යාව 79 දෙනෙකු වූ අතර ඉන් පුරප්පාඩු 10 ක් හා 14 දෙනෙකුගේ අතිරික්තයක් පැවැතිණි. | 2023.12.31 දිනට පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 10ක් හා අතිරික්ත සංඛ්‍යාව 14ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත්, අතිරික්තය ඵලදායී ලෙස අනුයුක්ත කිරීමටත් කටයුතු කළ යුතුවේ. |